# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,109 — 1935ක්වූ මාර්තු මස 8 වෙනි දිනවූ සිකුරාදා.

# Part IV.— හතරවෙනි කාණ්ඩය.

## ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම්.

### 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,021 (මහනුවර).

මීට යටකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම් කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1935ක්වූ මාර්තු මස 8වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඊට කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙසින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1934ක්වූ දෙසැම්බර් මස 18වෙනි දින මහනුවර කච්චේරියේදීය.

ඩී. සී. ආර්. ගුනවර්ධන,
මහනුවර පලාතේ උප ඒජන්ත උන්නාන්සේ වම්හ.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

#### උප ලේඛනය.

මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩදුම්බර කොට්ඨාසයේ ගම්පහ නැගෙණහිරකෝරළේ රන්කිරියාගොල්ල යන ගමේ පිහිටා තිබෙන මෙහි පහත සඳහන් බිම්කට්ටි, එනම්:—

මූල් සිතියමේ නො. 8,743.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 1 | වැලිකැටියේහේන .. .. | 3 | 1 | 3 |
| 2 | එම .. .. | 1 | 1 | 22 |
| 3 | එම (පාරට ඉතුරැකර තිබෙන බිම) .. | 0 | 0 | 14 |
| | | 4 | 2 | 39 |

මීට මායිම්—උතුරට එච්. බී. පිටපිල අයිතිකම්කියන වැලිකැටියේහේන; නැගෙණහිරට රන්කිරීගොල්ලේ සිට පිටවලට යනපාර; දකුණට ආණ්ඩුව අයිතිකම්කියන දෙඩන්අත්තේපොලපතන; බස්නාහිරට එච්. බී. පිටවල අයිතිකම්කියන වැලිකැටියේහේනද යනමේය.

### 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,022 (මහනුවර).

මීට යටකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1935ක්වූ මාර්තු මස 8වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මාවෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරණුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඊට කටයුතුකරණ බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙසින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1934ක්වූ දෙසැම්බර් මස 18වෙනි දින මහනුවර කච්චේරියේදීය.

ඩී. සී. ආර්. ගුනවර්ධන.
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්තඋන්නාන්සේ වම්හ.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

#### උප ලේඛනය.

මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩුනුවර කොට්ඨාසයේ කඩුපලාතකෝරළේ අඹන්වල යන ගමේ පිහිටා තිබෙන මෙහි පහත සඳහන් බිම්කැබෙලි, එනම්:—

මූල් සිතියමේ නො. A 83.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 1 | පල්ලේගල්දෙරුව නොහොත් දික්පතනේ හේනේවත්ත .. .. | 0 | 0 | 11 |
| 2 | පල්ලේගල්දෙරුව නොහොත් දික්පතනේ හේන .. .. | 1 | 3 | 38 |
| 3 | පල්ලේගල්දෙරුව නොහොත් දික්පතනේ හේනේවත්ත .. .. | 0 | 0 | 35 |
| 4 | පල්ලේගල්දෙරුව නොහොත් දික්පතනේ හේන (ගම්සභාපාරට ඉතුරැකර තිබෙන බිම) .. .. | 0 | 0 | 4 |
| | | 2 | 1 | 8 |

මීට මායිම්—උතුරට කේ. ඇම්. කර්බන්ඩා සහ එච්. ඇම්. මුදියන්සේ උරුමකියන දික්පතනේහේනේවත්ත (තේ); නැගෙණහිරට ඩබ්ලිව්. ඇම්. හිංගිරිබන්ඩා සහ තවත් අය උරුමකියන උඩගල්දෙරුවේවත්ත (තේ) සහ ඇම්. සිඤතු අයිතිකම්කියන උඩගල්දෙරුවේවත්ත (තේ); දකුණට එච්. ඇම්. පිකිරිබන්ඩා උරුමකියන කුඹල්දෙනියේවත්ත (තේ); බස්නාහිරට ගම්සහාපාර සහ එච්. ඇම්. පිකිරිබන්ඩා අයිතිකම්කියන කුඹල්දෙනියේවත්ත (තේ) ද යනාමේය.

---

1931 ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,023 (මහනුවර).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වම් 1935ක්වූ මාර්තු මස 8වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකොළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඊට කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වම් 1934ක්වූ දෙසැම්බර් මස 18වෙනි දින මහනුවර කච්චේරියේදීය.

ඩී. සී. ආර්. ගුනවර්ධන,
මහනුවර පලාතේ උප ඒජන්ත උන්නාන්සේ වම්හ.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩබුලත්ගම කෝරළේ පස්බාගේ කෝරළේ දෙකිද යන ගමේ පිහිටා තිබෙන මෙහි පහත සඳහන් බිම්කට්ටි, එනම්:—

මූල් සිතියම නො. 9,066.

| බිම්කට්ටිය | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | | |
|---|---|---|---|---|
| 1 | කිරිමැටිවලහේන නොහොත් කරයත්තාගේ හේන (දෙක්දමයට ඉතුරුකරතිබෙන බිම) | 0 | 1 | 37 |
| 3 | කිරිමැටියාවලහේන .. .. | 0 | 2 | 10 |
| 4 | එම (අඩිපාරට ඉතුරකරතිබෙන බිම) .. | 0 | 0 | 10 |
| | | 1 | 0 | 17 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් තීන්දුකරනලද බලත්තොටවත්ත (P. P. 9,066/2) සහ නොම්මර 44,994 දරණ පිඹුරුකඩදාසියපිට උරුමකියන ඉඩම; නැගෙණහිරට දෙකිද ඔය සහ නොම්මර 294,021 දරණ පිඹුරුකඩදාසියපිට උරුමකියන ඉඩම; දකුණට අඹගමුවේ සිට නාවලපිටියට යන අඩිපාර සහ ආණ්ඩුව අයිතිකම්කියන හොරකින්නේ පතන (P. P. 8,029/19); බස්නාහිරට නොම්මර 294,022 දරණ පිඹුරුකඩදාසියපිට උරුමකියන ඉඩමද යනාමේය.

---

1931 ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,024 (මහනුවර).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වම් 1935ක්වූ මාර්තු මස 8වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මාවෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඊට කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වම් 1934ක්වූ දෙසැම්බර් මස 18වෙනි දින මහනුවර කච්චේරියේදීය.

ඩී. සී. ආර්. ගුනවර්ධන,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ වම්හ.

(*a*) මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ හාරිස්පත්තුව කෝරළේ කුළුගම්මනසියපත්තුවේ යටිහලගල පල්ලේගම යන ගමේ පිහිටාතිබෙන මෙහි පහත සඳහන් බිම්කැබලි, එනම්:—

මූල් සිතියමේ නො. A. 104.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | | |
|---|---|---|---|---|
| 1 | කොහොලාන නොහොත් අත්තගලගෙදර හේන .. .. | 0 | 0 | 4·6 |
| 2 | එම .. .. | 0 | 0 | 11·1 |
| 3 | එම .. .. | 1 | 0 | 13·2 |
| | | 1 | 0 | 28·9 |

මීට මායිම්—උතුරට පී. කරුන්දු සහ තවත්අය උරුමකියන කොහොලානේහේන; නැගෙණහිරට (වියලීගිය) මහ ඇල, එච්. හවඩියා සහ තවත් අය අයිතිකම් කියන (අත්හැරදමාතිබෙන) කෙහෙල්හේනේ කුඹුර; දකුණට ඒ. පුන්චා සහ තවත් කෙනෙක් උරුමකියන යමානේහේන; බස්නාහිරට කේ. ඇන්. ඩී. නානායක්කාර උරුමකියන ගම්බරපිටියේ හේනද යනාමේය.

---

ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**Matara No. 37.**—දකුණු දිසාවේ මාතර දිස්ත්‍රික්කේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1935ක්වූ අප්‍රේල් මස 25වෙනි දින පෙරවරු 10ට හක්මන තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බදුදීමට හෝ දුප්පත් මිනිසුන්ට ඉඩම්දෙන ක්‍රමයට හෝ වෙනයම් විදියකින් දෙන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ මාතර දිස්ත්‍රික්කේ කන්දබඩපත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 61ක්.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිළ, රු. |
|---|---|---|---|---|---|---|---|
| | | කැලෑමැනීමේ මූල් සිතියමේ නො. 26. ගම—ඇපරලේ. | | | | | |
| 28 | හල්ගහදෙනිය .. | ඇපරලේ පදිංචි ආර්. ජයන්හාමි සහ තවත් අය .. | කුඹුර .. | 0 | 0 | 5 | 60 |
| | | කැලෑමැනීමේ මූල් සිතියමේ නො. 26. ගම—කුඩාපාන. | | | | | |
| 31 | හල්මුල්ල .. | කුඩාපානෙ පදිංචි මීදෙනෙගමගෙ දෙන් කරෝලිස් | කුඹුර .. | 0 | 0 | 14 | 60 |
| | | කැලෑමැනීමේ මූල් සිතියමේ නො. 26. ගම—ගොම්බද්දල. | | | | | |
| 48 | ඇහලකපහදූව .. | ගොම්බද්දල පදිංචි බෙල්පාගොඩගමගෙ අන්දිරිස් | කුඹුර .. | 0 | 0 | 24 | 60 |
| | | කැලෑමැනීමේ මූල් සිතියමේ නො. 26. ගම—බැරගම. | | | | | |
| 50 | කිරිමැටියවලදෙනිය . | බැරගම පදිංචි හේවාහල්පෙනෙ දෙන් චාර්ලිස් .. | කුඹුර .. | 0 | 1 | 39 | 60 |
| 51 | කපුරුකොලදෙනියෙවත්ත | එම .. .. | පොල්ආදිය .. | 2 | 3 | 15 | 60 |
| 53 | එම .. | එම .. .. | පැහිරි ආදිය .. | 1 | 2 | 22 | 60 |
| 54 | ඇල්ලබොඩදෙලේහේන | බැරගම පදිංචි හේවාහල්පෙගෙ දෙන් ජුවානිස් .. | කොස් ආදිය .. | 2 | 3 | 33 | 60 |
| | | කැලෑමැනීමේ මූල් සිතියමේ නො. 31. ගම—හොරපාවිට. | | | | | |
| 71 | පින්නකොලපැලැස්සේහේන | හොරපාවිට පදිංචි දෙන් නිකුලස් කුමහාරු .. | පැහිරි .. | 0 | 0 | 36 | 60 |
| | | අවසාන හම් සිතියමේ නො. 80. ගම—හිනිපැල්ල. | | | | | |
| 30AQ | දිද්දෙනිපොතවත්ත .. | යටියන පදිංචි බී. ඒ. රනවීර .. .. | රබර් .. | 0 | 0 | 14 | 60 |
| 30BJ | පොල්ගහදෙනිය .. | හිනිපැල්ලෙ පදිංචි අබේවික්‍රම දනපාල දෙන් මෙනස් සහ බී. පී. ඇල්. දෙන් කරෝලිස් | දෙනිය .. | 0 | 0 | 37 | 60 |

| නො. | ඉඩමේ නම. | අයිතිකම කියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 30BN | පොල්ගහදෙනියෙවතත | එම අබේවික්‍රම දනපාල දෙන් ජුවානිස් .. | පැඟිරි .. | 0 | 0 | 24 | 60 |
| 30BQ | හේනගෙදරවත්ත .. | එම හර්මානිස් දියස් සෙනරත් දහනායක ... | එම .. | 0 | 0 | 14 | 60 |
| 30DB | අඹගහඹකන්දෙවතත. | එම මුනසින් අතුකෝරලෙගෙ දිනෙස්හාමි .. | පොල්ආදිය .. | 0 | 0 | 21 | 60 |
| 30DO | මාතරගෙවත්ත .. | එම දහනායක දෙන් දවිත් .. | එම .. | 0 | 2 | 34 | 60 |
| | | අවසාන ගම් සිතියමේ නො. 90. ගම—පරපාමුල්ල. | | | | | |
| 3B1 | මුරුන්ගගහවත්ත .. | පරපාමුල්ලෙ පදිංචි සේනානායක දෙන් දවිත් සහ සේනානායක පුංචිඅප්පු | කොස් .. | 0 | 0 | 34 | 60 |
| 3E1 | බැද්දෙගෙදරවත්ත .. | එම දේවාලෙගම මහනැකතිගෙ පේදිරිස් .. | පුවක් ආදිය .. | 0 | 1 | 7 | 60 |
| 4AE | දෙලේකොරටුව .. | එම සේනානායකගේ කරෝලිස් .. | පොල් ආදිය .. | 0 | 0 | 29 | 60 |
| 4AY | බුරුතගහවත්ත .. | එම කුලප්පුආරච්චිගෙ අබරන් .. .. | පැඟිර .. | 0 | 2 | 1 | 60 |
| 4BP | හේවාගෙවත්ත .. | එම විදානෙපතිරනගෙ කරෝලිස් සහ සෙනරත් ජතුන්ආරච්චිගෙ දෙන් දවිත් | එම .. | 0 | 0 | 25 | 60 |
| 4BR | වීරවිජේවත්ත .. | එම කොක්මාදුවගෙ හාන්හාමි .. .. | එම .. | 0 | 0 | 14 | 60 |
| 4BT | ගුලුගහවත්ත .. | එම දෙන් කරෝලිස් වනිගනායක යාපා .. | එම .. | 0 | 2 | 30 | 60 |
| 4CD | එම .. | එම එම .. .. | එම .. | 0 | 0 | 23 | 60 |
| 4CE | මහයාය .. | එම දෙන් දවිත් අබේගුනසේකර විජේවත්ත .. | එම .. | 0 | 0 | 32 | 60 |
| 4CL | මහවත්ත .. | එම ආරච්චිගෙ ඩිංගිහාමි .. .. | එම .. | 0 | 0 | 16 | 60 |
| 38Y | පොල්ගහහේන .. | එම දෙන් තියදෝරිස් වනිගනායක යාපා .. | එම .. | 0 | 0 | 17 | 60 |
| 38AG | හිරිදෙනියෙවත්ත .. | එම කන්කානම්ගමාච්චිගෙ දවිත් .. | කොස් ආදිය .. | 0 | 0 | 36 | 60 |
| 99AI | ඇහලගහකොරටුව .. | එම කන්කානම්පන්ඩිතගෙ බබානිසා, හිනා සහ සෙලින්ද | පැඟිර .. | 0 | 0 | 24 | 60 |
| 99AK | යහලෙහේනකොරටුව | එම කන්කානම්පන්ඩිතගෙ බබානිසා, එම සුවරීසා සහ බඩහැලගෙ සාදිරීසා | රබර් ආදිය .. | 0 | 0 | 9 | 60 |
| 99BV | යහලෙහේන .. | එම දෙන් දියස් සේදර .. .. | පැඟිරි .. | 0 | 3 | 21 | 60 |
| 99BY | පුංචිගන්ගොඩදෙනිය . | එම කුලප්පුආරච්චිලියනගෙ දෙන් මනෙස්හාමි .. | කුඹුර .. | 0 | 1 | 20 | 90 |
| 99CJ | ගොඩවෙලගෙදර .. | එම මුනසින්ආරච්චිගෙ දෙන් බස්තියන් එම දෙන් කොත්තන් | පැඟිරි .. | 1 | 1 | 25 | 60 |
| 99CK | ඇල්හේන්දෙනිය .. | එම එම දෙන් බස්තියන් .. .. | කුඹුර .. | 0 | 0 | 19 | 90 |
| 99CQ | ඉහළකුඹුර .. | එම රනසින්ලියනගෙ දෙන් දවිත් .. | එම .. | 0 | 0 | 36 | 90 |
| 99CT | එගොඩහවත්ත .. | එම එම .. .. | පැඟිර .. | 0 | 1 | 18 | 60 |
| 99CU | පාලුවත්ත .. | එම විජේකෝන්ආරච්චිගෙ ජන්දිරිස්, දිනෝහාමි, බබුන් සහ ගුනහාමි | එම .. | 0 | 0 | 18 | 60 |
| 99DF | පැලවත්ත .. | එම රනසින් කළුමැදිරියගෙ සිමන්හාමි .. | එම .. | 0 | 1 | 31 | 60 |
| 101A18 | බටකැටියෙහේන .. | එම දෙන් තියදෝරිස් වන්නිනායක යාපා .. | එම .. | 0 | 1 | 17 | 60 |
| 101A20 | එම .. | එම එම .. .. | එම .. | 3 | 2 | 17 | 60 |
| 99DL | බටහේන්දෙනිය .. | එම රන්සින්ලියනගෙ දෙන් දුලියස් .. | කුඹුර .. | 0 | 0 | 19 | 90 |
| 99DN | බොරගොඩවත්ත .. | පරපාමුල්ලේ පදිංචි රනසින්ලියනගෙ අන්දිරිස් .. | පොල් ආදිය .. | 0 | 0 | 11 | 60 |
| 152C2 | බටුකොස්ගහහේන .. | එම යාපාගෙඅප්පු, රනසින්කළුමැදිරියගෙ සිමන් හාමි, රනසින්ලියනගෙ දෙන් දියෝනිස් | කොස් ආදිය .. | 0 | 0 | 34 | 60 |
| 4S5 | මැදකුඹුර .. | එම මහනැකතිගෙ බබන්කිරා .. | කුඹුර .. | 0 | 0 | 8 | 90* |
| 4CG | නුගගහවත්ත .. | එම ඒ. චාර්ලිස් .. .. | පැඟිරි .. | 0 | 0 | 3 | 60 |
| 4CH | අරඹවත්ත .. | එම එම .. .. | එම .. | 0 | 0 | 7 | 60 |
| | | අවසාන ගම් සිතියමේ නො. 92. ගම—හෙරලම්පිටිය. | | | | | |
| 8K | ඔමත්තෙවත්තෙහේන | හෙරලම්පිටියෙ පදිංචි දෙන් සයිමන් රාජපක්ෂ .. | පැඟිරි .. | 0 | 0 | 21 | 60 |
| | | අවසාන ගම් සිතියමේ නො. 95. ගම—හොරපාවිට. | | | | | |
| 2H | කහබිලියහේන .. | හොරපාවිට පදිංචි දෙන් අන්ද්‍රයස් කුඹසාරු .. | පැඟිරි .. | 1 | 3 | 8 | 70* |
| | | අවසාන ගම් සිතියමේ නො. 97. ගම—රන්වගොඩ. | | | | | |
| 56L22 | හික්කොටවත්ත .. | රන්වගොඩ පදිංචි ඩී. ඇම්. විමලගුණරත්නගේ උරුමක්කාරයෝ | පොල් .. | 0 | 0 | 35 | 70 |
| 143H | මිල්ලගහදෙනිය .. | එම .. .. | රබර් .. | 0 | 0 | 9 | 60 |
| 143I | මිල්ලගහහේන හෙවත් කොස්ගහහේන | එම .. .. | පැඟිරි .. | 0 | 1 | 38 | 60 |
| 143W | කොස්ගහහේන .. | එම .. .. | එම .. | 0 | 0 | 25 | 60 |
| | | අවසාන ගම් සිතියමේ නො. 100. ගම—රදාවෙල. | | | | | |
| 22S1 | විහාරන දෙලහේන හෙවත් ගල්ගොඩහේන | රදාවෙල පදිංචි හේවාහකුරුගෙ ලූසා .. | එම .. | 0 | 0 | 22 | 85* |
| | | අවසාන ගම් සිතියමේ නො. 131. ගම—ගම්මැද්දගම. | | | | | |
| 37O | දම්බොක්කෙවත්ත .. | ගම්මැද්දගම පදිංචි මුනසින්ආරච්චිගෙ ජුවානිස් .. | පැඟිරි .. | 0 | 3 | 10 | 60 |
| 61D | පොල්වත්ත .. | එම හෙට්ටිආරච්චිගෙ ලොකුහාමි .. | කොස් ආදිය .. | 0 | 0 | 30 | 60 |
| | | අවසාන ගම් සිතියමේ නො. 132. ගම—කැටියපේ. | | | | | |
| 1AE | දික්ගහගොඩවත්ත .. | කැටියපෙ පදිංචි කුලප්පුආරච්චිගේ අර්නෝලිස් .. | කිතුල් .. | 0 | 1 | 25 | 60 |
| 16R | ගල්කැටියපොලේදිවෙල්වත්ත | එම ඇම්. ජී. දෙන් ජේම්ස් .. .. | පොල් ආදිය .. | 0 | 2 | 15 | 60 |
| 16BS | සපුගහකුඹුර .. | එම මුනසින්ආරච්චිගෙ හෙන්ද්‍රික් සහ එම අල්ලිස් | කුඹුර .. | 0 | 0 | 32 | 90 |
| 1G2 | ඇල්හේන්දෙනිය .. | එම කුලප්පුආරච්චිගේ අන්දිරිස් එම දිසන් .. | දෙනිය .. | 0 | 0 | 21 | 60 |
| 1G3 | එම .. | එම හෙට්ටිආරච්චිගෙ හින්අප්පු, එම කුලප්පුආරච්චිගෙ දිසන් | පැඟිරි .. | 0 | 0 | 21 | 60 |
| 16Y | නුගගහවත්ත .. | එම මදුරසින්ගමගෙ දෙන් කොරනේලිස්, එම එම කරෝලිස් | පුවක් ආදිය .. | 0 | 3 | 36 | 60 |
| | | අවසාන ගම් සිතියමේ නො. 166. ගම—පල්ලවෙල. | | | | | |
| 25T2B | කැලන්තිරිගෙවතත | පල්ලවෙල පදිංචි හර්මානිස් අබේගුණසේකර .. | පැඟිරි .. | 0 | 0 | 25 | 60* |
| | | අවසාන ගම් සිතියමේ නො. 172. ගම—දෙනගම. | | | | | |
| 607C | දන්ගහහේන .. | දෙනගම පදිංචි පොරෝලිස් පාලික්කොන්ද .. | පොල් ආදිය | 0 | 1 | 15 | 60* |

* මෙම ලකුන දරන ඉඩම් කලින් මිලයටගෙන ගෙවන්ට තිබෙන ඉතුරු මුදල නොගෙවනලද බැවින් නැවත ප්‍රසිඬ කරනලදී.

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ මාතර උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1935ක්වූ මාර්තු මස 6වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පිටිපනේ ගැනු පාඨශාලාව පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

සිතියමේ නො. A 373. ගම—පිටිපනේ.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|
| 1 | කහටගහලන්ද | .. | පොල්ගස් 34ක්ද, කොස්ගහක් සහ මෙසන් වැඩ කරනලද ලිඳකින් යුත් පොල්ඉඩම | ඇම්. දෙන් නෝරිස්, පිටිපනේ | 0 | 2 | 0·8 |
| 2 | එම | .. | පොල්ගස් 26ක්ද, පොල්පැලයක්ද, තාවකාලික වැසිකිලියක් සහ ස්ථිර ගැනු පාඨශාලා ගොඩ නැගිල්ලකින් යුත් පොල්ඉඩම | එම .. | 0 | 1 | 27·7 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇතතාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1935ක්වූ අප්‍රේල් මස 2වෙනි දින පෙරවරු 10යේ කාලයමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒකොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1935ක්වූ මාර්තු මස 4වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ඩබ්ලිව්. හෝල්ම්ස්,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වර්‍ෂිත.

———

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කලපුගම ආණ්ඩුවේ පාඨශාලාව පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 454. ගම—කලපුගම.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|
| 1 | හොරේවත්ත | .. | අවුරුදු 12ක් වයස ඇති රබර්ගස් 4ක් සහ අවුරුදු 4ක් වයස ඇති රබර්ගස් 4ක් ඇති වත්ත | කලපුගම පදිංචි ගාලුගේ සයිමන් පේරා | 0 | 0 | 24·6 |
| 2 | එම | .. | අවුරුදු 4රේ 10යේ වයස ඇති රබර්ගස් 39ක්ද, අවුරුදු 6යේ 10යේ වයස ඇති හොරගස් 3ක්ද, අවුරුදු 6ක් වයස ඇති කැන්දගහක් සහ ස්ථිර සෙක්ල අත්තිවාරමකින් කොටසක් ඇති වත්ත | කලපුගම පදිංචි ඇතුලත්මුදලිගේ දෙන් පේරිස් අප්පුහාමි, ඇතුලත්මුදලිගේ දෙන් ලියෝරිස් අප්පුහාමි සහ ඇතුලත්මුදලිගේ දෙන් අල්පෙනිස් අප්පුහාමි (ඒකාබද්ධ) | 0 | 1 | 23·7 |
| 3 | එම | .. | අවුරුදු 20ක් වයස ඇති රබර්ගස් 32ක්ද, අවුරුදු 5ක් වයස ඇති කොස්ගහක්ද, අවුරුදු 25ක් වයස ඇති නාගහක්ද, ස්ථිර සෙක්ල අත්තිවාරමක කොටසක් සහ ස්ථිරනැති කක් කුස්සියකින් කොටසක් ඇති වත්ත | කලපුගම පදිංචි පුලතිංගේ හර මානිස් රොඩ්රිගු | 0 | 1 | 5 |
| 4 | එම | .. | අවුරුදු 15ක් වයස ඇති රබර්ගස් 3ක් සහ ස්ථිර සෙක්ල අත්තිවාරමකින් කොටසක් ඇති වත්ත | කලපුගම පදිංචි (1) කලපුගේ දෙන් මරතේලිස් අප්පුහාමි, කලපුගේ දෙන් මානිස් ගුණවර්ධන සහ කලපුගේ දෙන් පේද්‍රික් ගුණවර්ධන (ඒකාබද්ධ) | 0 | 0 | 22·2 |
| 5 | එම | .. | හිස්බිමක් සහ කොටසක අවුරුදු 15ක් වයස ඇති පොල් සහ රබර් වවාතිබෙන වත්ත | කලපුගම පදිංචි ගාලුගේ පේද්‍රික් පේරා | 0 | 0 | 4·3 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1935ක්වූ අප්‍රේල් මස 3වෙනි දින පෙරවරු 10යේ කාලයමට කළුතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1935ක්වූ මාර්තු මස 5වෙනි දින කළුතර කච්චේරියේදීය.

ජේ. ලයිව්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්‍ෂිත.

———

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම් :—තංගල්ලේ කඳුරුපොකුන පාර පලල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

මුල් සිතියමේ නො. A 244. ගම—තංගල්ල නාගරිකයතුල ඉදිපොකුනගොඩ සහ මරකකලගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | මසන්ගහකොරටුව, නාගරික නො. 369B, 369A, 369B යේ කොටස් | අවුරුදු 8ක පොල්ගස් 2ක්ද, අවුරුදු 4ක පොල්පැල 10ද, අවුරුදු දෙකක අඹ ගහක්ද, කෙහෙල් පඳුරු 5ද ඇති ඇති වත්ත | තික්කඩුවේ ලයනල් ගුනවර්ධනද, මාගෝවල පදිංචි ඇස්. ඇල්. අමරවීර සහ තංගල්ලේ බී. සී. ඔබේසිංහ සහ අබ්දුල් හමීඩ් හජියර | 0 | 0 | 10·3 |
| 2 | ගුරුපොකුනේවත්ත, නාගරික නො. 367A සහ 367B කොටස් | අවුරුදු 25ක පමන පොල්ගස් දෙකක්ද, අවුරුදු 5ක පොල්ගස් දෙකක්ද, උන පඳුරක්ද ඇති වත්ත | තික්කඩුවේ ලයනල් ගුනවර්ධනද, තංගල්ලේ ඩබ්ලිව්. සී. ඔබේසිංහද | 0 | 0 | 15 7 |
| 3 | ඒකනායකවත්ත, නාගරික නො. 221යේ කොටසක් | අවුරුදු 25ක පොල්ගස් 3ද, අවුරුදු 8ක පොල්ගස් දෙකක්ද, අවුරුදු 3–5 පමන පොල්පැල 9ද ඇති වත්ත | තංගල්ලේ සී. ඒ. වික්‍රමසූරිය මහතා | 0 | 0 | 11·7 |
| 4 | ඒකනායකවත්ත, නාගරික නො. 366A කොටස | අවුරුදු 35ක පොල්ගහක් ඇති වත්ත .. | තංගල්ලේ ඇල්. ජී. පොලියර් මහතා | 0 | 0 | 4·8 |
| 5 | අඹගහවත්ත, නාගරික නො. 365යේ කොටස | අවුරුදු 4ක දෙළුන්ගස් දෙකක්ද, කෙහෙල් පඳුරු 4ක්ද ඇති වත්ත | මාගෝ තැපැල් කන්තෝරුවේ ඇෆ්. ඇල්. අමරවීර මහතා | 0 | 0 | 6·6 |
| 6 | එම .. | හිස්ඉඩම .. .. | එම .. | 0 | 0 | 0·4 |
| 7 | කටුකුරුඳුගහවත්ත, නාගරික නො. 364රේ කොටසක් | අවුරුදු 8ක පොල්ගස් 8ක්ද, බදම බිත්තියකින් කොටසක්ද ඇති වත්ත | මරදානේ පොලිස් කන්තෝරුවේ ඇෆ්. ඩී. ද සිල්වා | 0 | 0 | 3·5 |

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයයි කියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 8 | කවුකුරුඳුගහවත්ත, නාගරික නො. 227යේ කොටස | අවුරුදු 20ක පොල්ගස් 3ද, අවුරුද්දක පොල්පැල දෙකක්ද, බදුම බිත්තියකින් කොටසක්ද ඇති වත්ත | වැල්ලවත්තේ මහවීදියේ නො. 53හේ පදිංචි ඩී. ඇම්. ජය සූරිය මහතා | 0 0 5 |
| 9 | පල්ලියවත්ත | .. බදුම තාප්ප කෑල්ලක් ඇති හිස් ඉඩම .. | තාංගල්ලේ පදිංචි ඒ. ඇල්. ඇම්. මජීඩ් | 0 0 0·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1935ක්වූ අප්‍රේල් මස 5වෙනි දින උදේ 9යේ කනිසමට තංගල් නානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල්ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1935ක්වූ පෙබරවාරි මස 27වෙනි දින හම්බන්තොට කච්චේරියෙදීය.

අත්සන්කළේ, පී. ජේ. හඩ්සන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3හේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—තංගල්ලේ පල්ලික්කුඩාවේ ගම මැදින් පාරක්තැනීම පිණිස මෙහිපහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

මුල් සිතියමේ නො. A 244. ගම—ඉදිපොකුණගොඩ සහ මරක්කලගොඩ.

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයයි කියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 10 | මසන්ගහකොරටුව නාගරික නො. 295A සහ 295B කොටස් | අවුරුදු 25 පොල්ගහක්ද, අවුරුදු 5ක පොල්ගස් දෙකක්ද, අවුරුදු 4ක දෙහිගස් 2ක්ද, කෙසෙල් පඳුරු 6ක්ද, අවුරුදු 2ක දොඩන්ගස් 3ක්ද ඇති වත්ත | තංගල්ලේ ඇස්. සමරසිංහ සහ ඇම්. ඇල්. ජයන්හාමි | 0 0 9 |
| 11 | අලකොරටුව නාගරික නො. 360 සහ 360A කොටස් | අවුරුදු 3–5ක පොල්ගස් 9ක්ද, අවුරුදු 3ක කොස්ගහක් ඇති වත්ත | තංගල්ලේ ඇම්. ඇස්. අබ්දුල්කාදර් සහ ඒ. ඇල්. පකීර් මහම්මදු | 0 0 9·3 |
| 12 | කොන්ගහවත්ත නාගරික නො. 361, 361A, 361B සහ 362යේ කොටස් | අවුරුදු 20ක පොල්ගස් 4ක්ද, අවුරුදු 3ක පොල්ගස් 11ක්ද, අවුරුදු 4ක අඹගස් 2ක්ද, දෙහිගස් 2ක්ද, කොස්ගස් 5ක්ද, අවුරුද්දක කොස්පැල 2ක්ද, අවුරුදු 4ක කජුගහක්ද කෙසෙල් පඳුරු 6ක්ද ඇතිවත්ත | තංගල්ලේ ඒ. ඇල්. ඇම්. අබ්දුල් හනීෆා, අයි. ඇල්. ඇම්. සමූන්, ඒ. ඇල්. ඇම්. සම්දීන්, ඒ. ඇල්. ඇම්. රහියනාත්උම්මා සහ පී. ඇල්. මජීඩ් | 0 0 18·4 |
| 13 | බොරළුහේන නාගරික නොම්මර 319 සහ 320යේ කොටස් | අවුරුදු 3ක අඹගහක්ද, ජූල්ගස් 2ක්ද, අවුරුදු 2ක දෙහිගහක්ද, අවුරුදු 10ක මාරගහක්ද ඇති වත්ත | තංගල්ලේ ඇල්. එච්. එන්සොහාමි, ඇම්. ඇම්. පොඩිහාමි, ඇම්. ඇම්. පොඩිසිඤ්ඤෝ, ඇම්. ඇම්. අඤ්ඤස් හාමි, ඇම්. ඇම්. දිනෝරිස්හාමි, ඇම්. ඇම්. හාඤියස්අප්පු | 0 0 8·3 |
| 14 | බොරළුහේන නාගරික නොම්මර 322යේ කොටසක් | හිස්ඉඩම .. .. | තංගල්ලේ ඇස්. ඩී. ඇම්. කාසිම් .. | 0 0 9·2 |
| 15 | බොරළුහේන නාගරික 317, 317A, 317B සහ 317C කොටස් | අවුරුදු 5ක ඉඹුල්ගස් 7ක්ද, අවුරුදු 2ක ජූල්ගහක්ද කජුගහක්ද ඇති වත්ත | තංගල්ලේ ආර්. එච්. හීන්හාමි, ඇම්. පී. ජසොහාමි, ඇම්. පී. අඤ්ඤස්හාමි සහ ආර්. පී. අප්පුසිඤ්ඤෝ | 0 0 11·3 |
| 17 | බොරළුහේන නාගරික නොම්මර 323 සහ 342D වල කොටස් | අවුරුදු 25ක පොල්ගස් 7ක්ද, අවුරුද්දක පොල්ගස් 11ක්, අවුරුදු 5ක ඉඹුල්ගහක්ද, අවුරුදු 8ක පේරගහක්ද ඇති වත්ත | නුවර ඒ. පී. ඇස්. අබේදීරද, ගල් පොත්තෙයාගේ ඒ. ඇස්. අප්පු සිඤ්ඤෝ අබේදීරද | 0 0 15·8 |
| 18 | බොරළුහේන නාගරික නොම්මර 243යේ කොටසක් | පුද්ගලික පාරක කොටසක් ඇති හිස් ඉඩම | තංගල්ලේ රෝමානු කතෝලික සභාව තංගල්ලේ ඒ. ඇම්. ප්‍රනාන්දු දෙවගැතිතැන | 0 0 5·7 |
| 19 | වාසලවලව්වේවත්ත නාගරික නොම්මර 324, 324A සහ 241 දරන කොටස් | බදුම තාප්පෙක කොටසක් ඇති හිස්ඉඩම | කහඑවේ පද්මා ජයවර්ධන නෝනා මහත්මී | 0 0 0·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1935ක්වූ අප්‍රේල් මස 5වෙනි දින අපරභාග 2යේ කනිසමට තංගල් නානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1935ක්වූ පෙබරවාරි මස 26වෙනි දින හම්බන්තොට කච්චේරියේදීය.

අත්සන්කළේ, පී. ජේ. හඩ්සන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

## ටැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

### රාගම කාශ රෝග ඉස්පිරිතාලේ මිනිසිපිටනිය ලොකු කිරීම පිණිස ගත්තලද ඉඩමේ ගස්වල බද්ද.

බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් රාගම කාශ රෝග ඉස්පිරිතාලේ මිනිසිපිටනිය ලොකුකිරීම පිණිස ගත්තලද පහත පෙනෙන උප ලේඛනයෙහි වඩා විස්තර ලෙස පෙන්නුම්කරනු ලබන ඉඩමේ ගස් වර්ෂ 1935ක්වූ අප්‍රේල් මස 1වෙනි දින පටන් 1ක් අවුරුදු 9මාසයකට පහත සඳහන්වන කොන්දේසිවලට යටත්ව බදු ගැනීමට ටැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර භාරගන්නා බව මෙයින් දැනුම්දෙමි.

2. සීල් තබනලද ටැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1935ක්වූ මාර්තු මස 22වෙනි දින දවල් 11හ වනතුරු කොළඹ කච්චේරියේදී භාරගන්නවා ඇත. සියලුම ඉල්ලුම්කරුවෝ ඉල්ලුම්පත්‍ර සැබෑ බව ඔප්පුවීමට තමන්ම නොහොත් තමා වෙනුවෙන් ක්‍රියාකරණ අයෙක් පෙනීසිටින්ට ඕනෑය.

කොන්දේසි.

1. භාරගනු ලබන ඉල්ලුම්පත්‍රය අයත් අය සම්පූර්ණ බදු මුදල වෙන්දේසි දිනයේදීම ගෙවිය යුතුයි.
2. ඉඩමේ කිසිම ගහක් කැපීමට බදුකාරයාට බලය නැත.
3. බදුකාරයා විසින් නොපැසුන ගෙඩි කැඩීම තහනම්ය.
4. බදුකාරයා සියලු වරිපනම් කාසි ගෙවන්ට ඕනෑය.
5. බදුකාරයා ඉඩමේ වල්පැලෑටි විරහිතව හොඳකොට තබාගත යුතුයි.
6. බදුකාරයාට මාසයකට කලින් දැනුම්දී නැවත ඉඩම භාරගන්ට ඒජන්ත උන්නාන්සේට හෝ ඔහුගේ බලය පිට ක්‍රියාකරන්නෙකුට බලය තිබේ.
7. බදුකාරයා විසින් ඒජන්ත උන්නාන්සේට හෝ ඔහුගේ බලය පිට ක්‍රියාකරන්නෙකුට ඉඩම පරීක්ෂාකර බැලීමට කොයියම් වේලාවක හමුත් ඉඩදිය යුතුයි.
8. කැපීමට උවමනාකරන ගස් සියල්ලක්ම ඒජන්ත උන්නාන්සේට කප්පවීමට බලය තිබේ. ඊට වැටහෙන මුදල බදුකාරයාට ආපසු දෙනුලැබේ.

9. බදුකාරයා විසින් ඒජන්ත උන්නාන්සේගෙන් ලිය විල්ලකින් ලබාගත් කැමැත්තක් නැතුව බද්දේ බුක්තිය වෙන අයෙකුට පැවරීම හෝ විකිණීම තහනම්ය.

10. එක් ඉල්ලුම්පත්‍රයක් හෝ සියලුම ඉල්ලුම්පත්‍ර භාර ගැනීමේ හෝ නොගැනීමේ බලය ඒජන්ත උන්නාන්සේ වෙත තබාගන්නාලදී.

උප ලේඛනය.

මුල් සිතියම නො. 20,367.

| කොටස්. | ගම. | ගස්. |
| --- | --- | --- |
| 1කේ සිට 7 දක්වා | අළුත්කුරුකෝරළේ රාගම් පත්තුවේ හොරපේගම | පලදාව ඇති පොල්ගස් 248යි, පැල පොල්ගස් 73යි, කොස්ගස් 12යි, දෙල්ගස් 4යි, පුවක් ගස් 214යි |

අත්සන්කළේ, ආර්. ඇම්. ඇම්. වර්ස්ලි,
බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1935ක්වූ මාර්තු මස 1වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

---

## 1920සේ නොම්මර 11 දරණ ප්‍රදේශික ආණ්ඩු ව්‍යවස්ථාව.

අම්බලන්ගොඩ පලාතේ ආණ්ඩු සභාවේ 6වෙනි කොට්ඨාසයට සාමාජිකයෙක් තේරීම.

අම්බලන්ගොඩ පලාත් ආණ්ඩු සභාවේ 6වෙනි කොට්ඨාසයට සාමාජිකයෙක් තේරීම වර්ෂ 1935ක්වූ අප්‍රේල් මස 3වෙනි දින (බදාදා) පවත්වන්ට අදහස්කර තිබෙන බව මෙයින් දැනුම් දෙමි. එක එක ඉල්ලුම්කාරයා සඳහා නාම යෝජනාකිරීම ලියවිල්ලෙන් කළයුතුවේ. ඔහු පත්වෙන්ට ඉල්ලා සිටින කොට්ඨාශයේ ඡන්දදායකයන්ගේ ලේඛනයේ නම් ඇතුළත්වූ අයවලුන්ගෙන් අඩුගණනේ දෙදෙනෙකු විසින් අත්සන් තබනලද නාම යෝජනා පත්‍රයක් එවැනි නාම යෝජනාපත්‍ර ඔප්පුකිරීමට නියමකර තිබෙන දිනය වන වර්ෂ 1935ක්වූ අප්‍රේල් මස 3වෙනි දින දවල් 10ට හෝ ඊට මත්තෙන් දිනව අම්බලන්ගොඩ පලාතේ ආණ්ඩු සභාවේ කන්තෝරුවට භාරදිය යුතුවේ.

මේ කොට්ඨාසයට එක ඉල්ලුම්කාරයෙකුට වැඩි ගණනක නාම යෝජනාකරණු ලැබුවොත් මෙහි පහත සඳහන් දිනයේ සහ වේලාවේදී ඒ කොට්ඨාසයට නියමකර තිබෙන ස්ථානයේදී ඡන්දවිමසීම කරණුවා ඇත.

| ඡන්ද විමසන ස්ථානය. | දින. | වේලාව. |
| --- | --- | --- |
| නො. 6 (වීලේගොඩ) කොට්ඨාසයට වීලේගොඩ පිහිටි "යෝනමී බාලිකා" නම් ගැහැණු ලමයින්ගේ පාඨශාලාව | වර්ෂ 1935ක්වූ අප්‍රේල් මස 13වෙනි දින | උදේ 9ගේ සිට දවල් 12 දක්වා |

ඩබ්ලිව්. ජේ. ඇල්. රොජර්සන්,
දකුණු දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

වර්ෂ 1935ක්වූ පෙබරවාරි මස 28වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

---

## නොතාරිස්වරුන් වීමට ඉල්ලුම්කරන්නන්ගේ ඇතුලත්වීමේ පාඩම් විභාගය.

නොතාරිස්වරුන් වීමට ඉල්ලුම්කරන්නන්ගේ ඇතුලත් වීමේ පාඩම් විභාගය සම්බන්ධ දැන්වීමයි.

සිංහල භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීම සඳහා ඒ ධුරයට පත්වීම පිණිස නීතිය ඉගෙනගැනීමට බැඳෙන්ට අවසර ඉල්ලන අයවළුන් සම්බන්ධව පාඩම් විභාගයක් වර්ෂ 1935ක්වූ දෙසැම්බර් මස 3වෙනි දින සහ ඊට පසු දවස්වලදීත් අධ්‍යාපනාධ්‍යක්ෂකතුමා විසින් කොළඹදී පවත්වනු ලැබේ.

2. විභාගයට පෙණීසිටීමට ඉල්ලුම්කිරීමට ප්‍රථම එක එක අයදුම්කරු විසින් අඩුම ගණනේ ඊට තුන්මාසයක් කලින් තමා වාසයකරණ පළාතේ ආණ්ඩුවේ ඒජන්තතුමාට දැන්වීමක් යවන්ට ඕනෑය. ඒ දැන්වීමෙහි ඉල්ලුම්කරු නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට අදහස්කරගෙන තිබෙන භාෂාව සහ දිස්ත්‍රික්කයත් සඳහන් කළයුතුවත් හැර ඒ ඉල්ලුම්පත්‍රය යවන්ට ප්‍රථම එකී තුන්මාසය ගතවී තිබෙන්ටද ඕනෑය.

3. ඒ ඉල්ලුම්පත්‍ර රීජිස්ට්‍රාර් ජනරාල්තුමාට වර්ෂ 1907 අංක 1කේ ආඥාපණතේ 11වෙනි ෂැඩුල් ලේඛනයේ දක්වා තිබෙන ෆෝර්මයේ ප්‍රකාර ඉංග්‍රීසි භාෂාවෙන් ලියනලද්දක් වියයුතු වත් හැර එකී මෙහි පහත පෙණෙන කරුණුත් සඳහන්කළ යුතුයි.

(1) ඉල්ලුම්කරු වාසයකරණ ස්ථානය.
(2) ඇගේ හෝ ඔහුගේ වයස.
(3) ඉගෙනීම පිණිස බැඳෙන්ට ඈ හෝ ඔහු අදහස්කරගෙන සිටින අද්වකාත්නැන හෝ ප්‍රොක්ටර්තැනගේ නම.
(4) ඈ හෝ ඔහු නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට අදහස්කරගෙන තිබෙන දිස්ත්‍රික්කය සහ භාෂාව.

4. වර්ෂ 1927 නො. 24 දරණ ආඥාපණතින් සංශෝධනය කරණලද වර්ෂ 1907 නො. 1 දරණ ආඥාපණතේ 7වෙනි කොට්ඨාසයේ දෙවෙනි වගන්තියේ ප්‍රකාර පත්වීම පිණිස ඉල්ලුම්කරුන් උදෙසා එක් දිස්ත්‍රික්කයට එක් ඇබෑර්තුව බැගින් බදුල්ල, අනුරාධපුර සහ මඩකලපුව යන තුන් දිස්ත්‍රික්කයෙහිම ඇබෑර්තු තුනක් වෙන්කර තිබේ.

එවැනි ඉල්ලුම්කරුන් මෙහි පහත දක්වන සුදුසුකම්වලින් එකකට හෝ වැඩිගණනකට හිමිකරුවන් වියයුතු බවටත් සාක්ෂි ඔප්පුකළ යුතුයි.

(ඒ) ඉකුත්ව ගිය දශවර්ෂය තුල ඒ දිස්ත්‍රික්කයේ ඔහු විසින් හෝ ඈ විසින් නොහොත් ඔහුගේ ස්ත්‍රී විසින් හෝ ඇගේ පුරුෂයා විසින් නොහොත් ස්ත්‍රීගේ උරුමයෙන් ඔහු විසින් හෝ පුරුෂයාගේ උරුමයෙන් ඈ විසින් නිරවුල්ව නොකඩවා භුක්ති විඳීමේ අයිතිවාසිය ඇති ඉඩම් හිමිවියයුතු හැර—
(බී) උත්පත්තිය ඒ දිස්ත්‍රික්කයෙහිම සිදුවී තිබියයුතු බවද,
(සී) වරින්වර හෝ නොකඩවා අවුරුදු 10කට අඩුනොවන කාලයක් ඒ දිස්ත්‍රික්කයේ පදිංචියද වියයුතුයි.

5. ඒ ඉල්ලුම්පත්‍රයෙහි "Ceylon Postage and Revenue" යන වචන දරණ රුපියල් 10ක මුද්දරයක් අලවා නියයාකාර අවලංගුකළ යුතුය. තවද (අ) ඉල්ලුම්කරු විසින් ආණ්ඩුවේ ඒජන්තතුමාට දැන් දැන්වීම ලැබුන බව දන්වා එවූ ලියවිල්ලද, (ආ) ඇගේ හෝ ඔහුගේ කල්ක්‍රියාව සහ සුදුසුකම් ගැන සහතිකපත්‍රද ඉන් එකක්වත් අඩුම ගණනේ තුන් මාසයකට වඩා පරණ නොවූ සහතික පත්‍රයක් වියයුතුයි. ඈ හෝ ඔහු රක්ෂාවක යෙදී සිටි කෙනෙක් නම් අන්තිමට සේවය කළ ස්වාමියාගේ සහතිකපත්‍රයක්ද ඇමිනියයුතුවා සහ (ඉ) උප්පැන්න සහතිකයද ඒ අයදුම්පතට අමුණා එවිය යුතුයි.

6. ඉල්ලුම්කරුවෝ නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට අදහස්කරගෙන සිටින භාෂාවෙන් ඔවුන්ගේ අත්අකුරෙන් ලියනලද අයදුම්පත්ද ඉහතකී ඉංග්‍රීසියෙන් ලියනලද අයදුම්පත් සමග එවිය යුතුයි.

7. වර්ෂ 1935ක්වූ ඔක්තෝබර් මස 15වෙනි දින පස්වරු 2ට ප්‍රථම අයදුම්පත් මෙම කන්තෝරුවට ලැබිය යුතුයි.

8. තම තමා හඳුන්වාදීම පිණිසත් විභාගයට භාරගැණීමට දෙන අවසරපත්‍ර ලබාගැණීම පිණිසත් ඉල්ලුම්කරුවන් විසින් වර්ෂ 1935 නොවැම්බර් මස 25–29වෙනි දින සහ දෙසැම්බර් 2වෙනි දින යන දවස්වලින් කොයිම දිනකදී නමුත් පෙරවරු 10 සිට පස්වරු 4 දක්වා මෙම කන්තෝරුවට පැමිණිය යුතුයි.

9. විභාගය සම්බන්ධ පාඩම් මෙහි පහත පෙණෙන ලේඛනයේ දක්වනලදුවත් හැර එක එක පාඩමට දෙන ලකුණු ගණන් හා ඒ සම්බන්ධව කාලවක්‍රයද ඇතුලත්කරණලදී.

10. ඉල්ලුම්කරුවෝ ලිපිකිරීමෙන්ද, වාක්‍ය ලිවීමෙන්ද, කියවීමෙන් සහ ව්‍යාකරණයෙන්ද විභාගයට නොපෙණී සිටින්ටනම් ප්‍රාචීන භාෂා සමිතියේ මධ්‍යම හෝ අවසාන විභාගයෙන්ද එසේ නැතහොත් ලන්ඩන් හෝ මද්‍රාසි සමස්ත ශාස්ත්‍රශාලාවල බී. ඒ. නාමෝපලක්ෂිතවූ විභාගයේ සිංහල සහ දෙමළ කොටස්වලින් සමත්වූ අය වියයුතුයි. එසේ සමත් වූවාවූ ඉල්ලුම්කරුවෝ ඒ බව ඔප්පුකිරීමට යෝග්‍ය සහතික පත් එවිය යුතුය.

ජේ. සී. ඩබ්ලිව්. රොක්,
රෙජිෂ්ට්‍රාර් ජනරාල්.

වර්ෂ 1935ක්වූ මාර්තු මස 5වෙනි දින කොළඹ
රෙජිෂ්ට්‍රාර් ජනරාල් කන්තෝරුවේදීය.

ඉහත සඳහන්කරණලද ලේඛනය.

විභාග පාඩම් නාම සහ ලකුණු.

| | | සම්පූර්ණ ලකුණු ගණන. |
| --- | --- | --- |
| අංක ගණිතය | .. | 100 |
| ලිපිකිරීම | ලිවීම .. | 50 |
| | හරියාකාර අකුරු යෙදීම .. | 50 |
| වාක්‍ය ලිවීම | .. | 50 |
| කියවීම .. | .. | 50 |
| ව්‍යාකරණ | .. | 100 |

කාලවක්‍රය.

| | |
| --- | --- |
| වර්ෂ 1935 දෙසැම්බර් මස 3වෙනි දිනදී | පෙරවරු 9–11 දක්වා අංක ගණිතය, (සිංහල සහ දෙමළ). |
| | පෙරවරු 11–11.30 දක්වා ලිපිකිරීම, (සිංහල සහ දෙමළ). |
| | පස්වරු 12.45–1.45 දක්වා වාක්‍ය ලිවීම, (සිංහල සහ දෙමළ). |
| | පස්වරු 2–3.30 දක්වා ව්‍යාකරණ, (සිංහල සහ දෙමළ). |
| | ඊටපසු දිනවල කියවීම, (සිංහල සහ දෙමළ). |

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.